සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

54 S I

## දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

## Second Term Test - Grade 13 - 2020

විභාග අංකය ................................. **පෙරදිග සංගීතය I** කාලය පැය දෙකයි

**උපදෙස්**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.
- 31 - 50 දක්වා උත්තර පත්‍රයේම පිළිතුරු සපයන්න.

01. නි̣ ස ග ම රි̱ රි̱ ස ....... ස්වර සංගතිය අයත් නිර්දේශිත රාගය වන්නේ,

i. දේශ් ii. භාගේශ්‍රී iii. කාලිංගඩා iv. භෛරව v. ආශාවරී (........)

02. පහත දැක්වෙන තොරතුරු අතුරින් භෛරව රාගයට අයත් **නොවන** ලක්ෂණ ඇතුළත් වරණය තෝරන්න.


i. උදය සන්ධි ප්‍රකාශ රාගයකි.
ii. උත්තරාංගවාදී රාගයකි.
iii. රිෂභය හා ධෛවතය ආන්දෝලනය කෙරේ.
iv. කාලිංගඩා රාගයට සම ප්‍රකෘති වේ.
v. භෛරවී ඨාටයෙන් නිර්මාණය වී ඇත. (........)

03. විලම්භිත ඛ්‍යාල් ගීතයක අංග ඇතුළත් වරණය වන්නේ,

i. පූර්වාලාප, ස්ථායි, මධ්‍යලාප, අන්තරා, බෝල් ආලාප, තානාලංකාර
ii. පූර්වාලාප, බෝල් ආලාප, ස්ථායි, අන්තරා, තානාලංකාර, ජලා
iii පූර්වාලාප, ස්ථායි, අන්තරා, ගත්, බෝල් ආලාප, මධ්‍යාලාප
iv. පූර්වාලාප, පල්ලවී, අනුපල්ලවී, මධ්‍යාලාප, බෝල් ආලාප, තානාලංකාර
v. පූර්වාලාප, ස්ථායි, අන්තරා, චක්‍රදාර්, තානාලංකාර (........)

04. ''ධිං, න, ධිධි, නා, තිං, නා, ධි, ධි, නා

ඉහත දක්වා ඇති අවනද්ධාක්ෂර පිළිවෙලින් වාදනය කිරීමෙන් ''හින්ච්'' තාලයේ ඨේකාව වාදනය වේ. එම හින්ච් තාලය නිවැරදිව ප්‍රස්තාර කර ඇති වරණය තෝරන්න.




(........)

05. වේද යුගයේ සංගීතය පිළිබඳ තොරතුරු විස්තරාත්මකව දක්වා ඇත්තේ,

i. ඍග් වේදය ii. යජුර් වේදය iii. සාම වේදය iv. අතර්වන් වේදය v. පංච වේදය (........)

06. ''වීරාව '' ගෝත්‍රයෙන් බිහිවූ බවට මතයක් ඇති භාරතීය සංගීතයේ නිර්දේශිත රාගය වන්නේ,

i. භාගේශ්‍රී ii. දේස් iii. ආසාවරී iv. ජයජයවන්ති v. භෛරව (........)

07. සාරාංග දේව පඬිතුමා විසින් රචිත ග්‍රන්ථයක් වන්නේ,

i. සංගීත රත්නාකරය ii. ගීත ගෝවින්දය iii. ක්‍රමික් පුස්තක්මාලිකා

iv. සංගීත සම්භවය v. සංගීත කෞමදී (........)

08. ලාංකේය චිත්‍රපට ඉතිහාසය පිළිබඳ පහත දක්වා ඇති තොරතුරු ඇසුරින් **සාවද්‍ය** තොරතුරු ඇතුළත් වරණය වන්නේ,

i. මුල් යුගයේ චිත්‍රපට ආරම්භය 1947 දී ඇරඹුනි.
ii. 1957 මෙහි දෙවැනි දශකයේ ආරම්භයයි.
iii. 1956 දී රේඛාව චිත්‍රපට තිරගත විය.
iv. 1967 න් ඇරඹී තෙවැනි යුගය තුළදී චිත්‍රපට කලාවේ සාධනීය ප්‍රවණතා ඇතිවුණි.
v. 1967 දී තිරගත වූ සත් සමුදුර චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂක ඩබ්.ඩී. අමරදේව ශූරීන් ය. (........)

09. පහත දක්වා ඇති තාල රූපයන් අතරින් විභාගයන් සියල්ල අතර මාත්‍රා අසමානව ප්‍රස්තාර වන තාලය වන්නේ,

i. ජප් ii. දීප්චන්දි iii. තිලවඩා iv. චෞතාල් v. ධමාර් (........)

**පහත දැක්වෙන ස්වර ප්‍රස්තාරය ඇසුරින් 10 - 12 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

|ම ගු ම | (නි) - ධනි |ස්නි ධනි ස- |මගු -මු ගුරි ස-

10. ඉහත දැක්වෙන ස්වර ප්‍රස්තාරය අදාළ වන නිර්දේශිත රාගය වන්නේ,

i. භාගේශ්‍රී ii. දේස් iii. කාලිංගඩා iv. ආසාවරී v. ජෞනපුරි (........)

11. ඉහත ප්‍රස්තාරය දක්වා ඇති තාලයට අමතරව එම ස්වර ප්‍රස්තාරය වාදනය කළ හැකි වෙනත් තාලයක් වන්නේ,

i. ත්‍රිතාලය යි ii. ඒක් තාලයයි iii. රූපක් තාලයයි
iv. චෞ තාලයයි. v. ජප් තාලයයි. (........)

12. ස්වර ප්‍රස්තාරයේ දෙවන විභාගය තුල නි ස්වරයට අදාල '' ( ) '' සංකේතයෙන් දැක්වෙනුයේ,
i. කන් ස්වරයකි. ii. මූර්කි ස්වරයකි. iii. මීන්ඩ් ස්වරයකි.

iv. ආන්දෝලන ස්වරයකි. v. ගමක් ස්වරයකි. (........)

13. නිසධනිරි / රිගුරිසනිසධනිරි / මෙහි ඊළග පියවර සඳහා වඩාත් උචිත ස්වර රටාව තෝරන්න.

i. රිපමපමගරිසනිසධනිරි ii. රිගපමගරිස, නිසධනිරි iii. සසරිරිගගසරිපපධපධනිරි
iv. රිගමගරිගුරිසනිසධනිරි v. මගමපමගුරිසනිසධනිරි (........)

14. විවිධ ස්වර පරාසයන්ට අයත් සංගීත භාණ්ඩ රාශියක් භාවිතා කරමින් වාදකයින් අවම වශයෙන් 35 ක් වත් සිටිය යුතු අපරදිග සංගීත නිර්මාණ විශේෂය වන්නේ,

i. ඔපෙරා ii. කැන්ටාටා iii. සංධ්වනි iv. ඔරටෝරියෝ v. ක්වාර්ටට් (........)

15. අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණයේ එන '' සැක්සෆෝනය' අයත් වන්නේ,

i. ලෝහමය සුෂිර වාද්‍ය භාණ්ඩ සණයටය.

ii. දැවමය ඉපියාවක් සහිත සුෂිර භාණ්ඩ සණයටය.

iii. දැවමය ඉපියා දෙකක් සහිත සුෂිර භාන්ඩ සණයටය.

iv. දැවමය ඉපියා රහිත සුෂිර භාණ්ඩ සණයටය.

v. ලෝහමය ඉපියා සහිත සුෂිර භාණ්ඩ සණයටය. (........)

16. මහනුවර යුගයේ කවිකාර මඩුව ඇසුරින් නිර්මාණය වූ ගීත සම්ප්‍රදායකට අයත් **නොවන** ගීතය ඇතුළත් වරණය තෝරන්න.

i. භානු සේ ගිමා සඳ දෙය ii. ලක්ෂමී බුජවාසා

iii. වරමාතී සුභ චරිතේ iv. තුරු රත්න සිරි ලෙසිනා

v. ගම්භීරත් තාලෙට වාලග (........)

17. Semi tone + tone + Semi tone වශයෙන් ස්වර අන්තර පිහිටා ඇති ස්වර ඇතුළත් වරණය තෝරන්න.

i. $C^\# D^\# E^\# F^\#$ ii. $D, D^\#, E^\#, F^\#$ iii. E F G A iv. $F\ G\ A^b\ B^b$ v. $G\ A^b\ B\ C^\#$ (........)

18. කර්ණේන්ද්‍රියේ පහත දැක්වෙන කොටස් අතරින් ශරීරයේ සමබරතාව ඇති කිරීමට හේතු වන කොටස ඇතුළත් වරණය තෝරන්න.

i. කර්ණපටහ පටලය ii. මුද්ගරිකාව, නිසාතිය, දරණකය iii. යුෂ්ටේකීය නාලය

iv. අර්ධ කවාකාර නාල v. කොක්ලියා ස්නායුව (........)

19. 'හොවාර්ඩ් ගාර්ඩින්' ගේ බහුවිධ බුද්ධි න්‍යායට ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

i. සංගීත රිද්මයානුකුල බුද්ධිය ii. කායික සංචලනමය බුද්ධිය iii. චින්තනමය බුද්ධිය

iv. අන්තර් පුද්ගල බුද්ධිය v. වාචසික භාෂාමය බුද්ධිය (........)

20. පරමේල ප්‍රවේශක රාගයකි.

i. භාගේශ්‍රී ii. භෛරව iii. ජයජයවන්ති iv. දේස් v. කාලිංගඩා (........)

21. නිර්දේශිත සම ප්‍රකෘති රාග යුගලයකි,

i. දේස් - භෛරව ii. භෛරව - තිලක්කාමෝද් iii. කාලිංගඩා - තිලක්කාමෝද්

iv. භෛරව - ආශාවරී v. දේස් - තිලක්කාමෝද් (........)

22. දේස් රාගයේ විවාදී ස්වරය

i. කෝමල රිෂභය ii. කෝමල ගාන්ධාරය iii. තීව්‍ර මධ්‍යමය

iv. කෝමල නිෂාදය v. කෝමල ධෛවතය (........)

23. ගායනයේ දී ශ්‍රැතිය ස්ථාවරව පවත්වා ගැනීම සඳහා වඩාත් උචිත ක්‍රමය වන්නේ,

i. ස්වර අභ්‍යාසය පුහුණු වීමයි. ii. රාග ගායනය පුහුණුවයි.

iii. බුද්ධ ස්තෝත්‍රය ගායනය පුහුණුවයි. iv. දීර්ඝ හුස්ම ගැනීමේ අභ්‍යාස පුහුණුවයි.

v. ආලාප ගායනය පුහුණුවයි. (........)

24. මාත්‍රා 14 - 16 කින් යුත් තාල දෙකක බලිස්ථාන පිහිටන මාත්‍රාව පිළිවෙලින්,

i. 9 - 8 ii. 9 - 7 iii. 8 - 9 iv. 8 - 8 v. 9 - 6 (........)

25. චෞ තාල්, සූල් තාල්, තීව්‍රා යන තාල වාදනය කරනු ලබන අවනද්ධ භාණ්ඩය,

i. පකාවාජයයි. ii. තබ්ලාව යි. iii. මෘදංගයයි.
iv. ඩෝලයයි. v. සටම් (........)

26. පරිගණක සංගීතයේ දී ස්ටේන්බර්ග් (Steinberg) සමාගම විසින් නිර්මාණය කළ ලොව වැඩියෙන්ම භාවිතා වන මෘදුකාංගයකි.

i. Nuendo ii. Sound forge iii. Fruty Loop
iv. Cubase v. Reason (........)

27. භාත්ඛණ්ඩේ සංගීත විභාගයට අත්වැලක් වන කාණ්ඩ හතරකින් යුත් 'Musicology of India' ග්‍රන්ථයෙහි කතෘවරයා,

i. පණ්ඩිත් අනින්දෝ චැටර්ජි ii. උස්තාද් ආකාශ් හුසේන් iii. උස්තාද් ශකීර් හුසේන්
iv. පණ්ඩිත් ප්‍රකාෂ් ගෝෂ් v. මහචාර්ය වී.එස්.නිගාම් (........)

28. ප්‍රශස්ති ගී පාදයක් **නොවන්නේ,**

i. තුරු රත්න සිරි ලෙසිනා ii. වරමාතී සුභ චරිතේ iii. පුරණ සමුදුර දුවන නැව් දැකලා
iv. නොමදින් විකුම්පාලා v. භාණු සේ ගිමා සඳ දෙය (........)

**අංක 29 -30 ප්‍රශ්ණ සඳහා පිළිතුරු සැපයීමට පහත ප්‍රස්තාරය උපයෝගී කරගන්න.**

| | | | |
|---|---|---|---|
| ස්ව ර තාS ල | ද රා S ග | අ ල ං කෘ | ත ස S ව රි |
| ම ප ධ ධ | ස් - රි් ස් | ධ ධ ස ග් | රි් ස් ධ ප |
| සරි මප ධ- ස්- | ස්නි ධප මගු රිස | දී ම් ත න | දෙ රෙ න දි |
| තිට කත ගදි ගෙන | ධ+ තිට කත | ගදි ගෙන ධා + | තිට කත ගදි ගෙන \| ධා |

29. ඉහත ප්‍රස්තාරයට අදාල ගායන ශෛලිය වන්නේ,

i. තරාණා ය. ii. චතුරංග ය. iii. ධමාර් ය. iv. සර්ගම් ය. v. ඛ්‍යාල් ය. (........)

30. ඉහත අවනද්ධාක්ෂර තුළින් නිරූපණය වන තාල වාද්‍ය අලංකරණ විශේෂය වන්නේ,

i. තිහායි ය. ii. චක්‍රදාර් ය. iii. ගත් ය. iv. පරන් ය. v. රේලා ය. (........)

**31 සිට 50 දක්වා ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුරු යොදා ඇති හිස්තැන් පුරවන්න.**

31. ලෝක සංගීත සම්ප්‍රදායන් අතරින් අග්නිදිග ආසියානු රටවල් අතර ප්‍රචලිත සංගීත සම්ප්‍රදාය ........................................... සංගීතය ලෙස ප්‍රසිද්ධ අතර මකාමත් සංගීතය වශයෙන් ප්‍රසිද්ධව පවතින්නේ ....................................................... සංගීත සම්ප්‍රදායයි.

32. ලෝක ප්‍රසිද්ධ භාරතීය සංගීතඥයකු වන උස්තාද් 'බඩේ ගුලාම් අලි ඛාන්' .................................................... ගායන ශිල්පියකු ලෙස ප්‍රසිද්ධ වන අතර .............................. ගායකයෙකු ලෙස ද ප්‍රසිද්ධියක් උසුලයි.

33. 'කටේ කිරි සුවඳ යන්නට පවා බැරිවුනා' මෙම ගීතය ඇතුලත් සිංහල චිත්‍රපටය ................................. වන අතර එහි සංගීත අධ්‍යක්ෂක වන්නේ ......................................... සංගීතඥයාය.

34. රාගධාරී සංගීතයේ දී සන්ධි ප්‍රකාශ රාගයන් හි ධෛවතය හා ....................................... යන ස්වර කෝමලව යෙදෙන අතර මධ්‍යමය ....................................... ස්වරය ලෙස හඳුන්වයි.

35. 'ලංකාවේ සංගීත සම්භවය' කෘතිය .......................................... මහතාගේ කෘතියක් වන අතර 'සිංහල ගැමි නාටකය' ...................................... ශූරීන් ගේ කෘතියකි.

36. කඩවර කංකාරිය .................................... ශාන්ති කර්ම සම්ප්‍රදායටත්, කිරිමඩු ශාන්තිකර්මය ............................. සම්ප්‍රදායටත් අයත් වේ.

37. ලාංකීය ගැමි නාටක කලාවේ ප්‍රචලිත ගීත අතර 'පාට වරුණ පුත' ගීතය ............................. ගැමි නාටකයටත් 'මං ලෙස සොබනා' ගීතය ................................ ගැමි නාටක සම්ප්‍රදායට අයත්ය.

38. ටී.එම්. ජයරත්නයන් ගායනා කරන 'උදුම්බරා' ගීතය .................................. චිත්‍රපටයේ ඇතුළත් ගීතයක් වන අතර රේඛාව චිත්‍රපටයේ එන 'ඕලු නෙලුම් නෙරිය රඟාලා' ගීතය .................................... ශූරීන් විසින් ගායනා කරන ගීතයකි.

39. ................................. රාගයේ මුඛ්‍යාංගය මපනි ධප, මපගු, රිමප ලෙස යෙදෙන අතර ................................... රාගයේ මුඛ්‍යාංගය රිමප, නි ධප ලෙස යෙදේ.

40. 'තත් ජිත් තොන් නම්' මෙම ගී පාදය .......................................... ට අයත් වන අතර මංගලම් ගායනය ................................................ තිත් රූපයට අනුව ගායනය කරයි.

41. $B^b$ මේජර් ස්කේලයට ......................................... ස්වර අයත් වන අතර 'රිමධ' ස්වර සංචය (chord) එක අයත් වන්නේ ....................................... ස්කේලයට ය.

42. භාරතීය සංගීතය ................................... හින්දු යුගය, ................................ , නූතන යුගය ලෙස යුග හතරකි.

43. වාචික අභිනයෙන් තොර අපරදිග රංග සම්ප්‍රදාය ............................ නමින් හඳුන්වන අතර ............................... රංග ශෛලිය සඳහා ගායනය සුවිශේෂ ව යොදා ගනී.

44. 'අන්ද්‍ර ගුවන් හැර නැංග අසුන් පිට' යන ගී පාදය ............................. ශාන්ති කර්ම ගීතයක් වන අතර ' හිස වුව තුළ බෙල්ල දෙවුර' ගී පාදය ............................................ ශාන්ති කර්ම ගීතයකි.

45. 'Great Fantasia' සංගීත කෘතිය ............................................... සංගීතඥයාගේ නිර්මාණ කෘතියක් වන අතර Mass ගායනා 15 ක් පමණ නිර්මාණය කළේ ............................................. විසිනි.

46. 'උකුසා වන්නම' ආශ්‍රිත වාදන කෘතිය ............................ සංගීතඥයාගේ නිර්මාණ කෘතියක් වන අතර 'මාර පරාජය' නම් වූ වාදන කෘතිය ............................................ මහතාගේ නිර්මාණයකි.

47. දක්ෂිණ භාරතීය ............................................... නම් වීදි නාට්‍ය ආභාසයෙන් .................................... රංග සම්ප්‍රදාය නිර්මාණය වී ඇත.

48. 'මිහිරි නාද කෝකිලාදි' යන ගීතය ....................................... නූර්තියේ ඇතුළත් වන අතර එම නාට්‍ය රචකයා ...................................... ශූරීන් ය.

49. රජයේ සංගීත විද්‍යාලයේ අධිපති ලෙස මුල් වරට පත්වූ .................................... මහතා 1940 වසරේ දී ............................................... පත්‍රය හිමිකර ගනු ලැබීය.

50. අපරදිග ස්වර ප්‍රස්තාර කරණයේ එන Repetition mark එකක් ලෙස .................................... සලකුණු කරන අතර 𝄋 මෙම සලකුණ ............................................ නමින් හඳුන්වයි.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

54 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

Second Term Test - Grade 13 - 2020

විභාග අංකය ................................. **පෙරදිග සංගීතය II** කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකකට ද II කොටසින් ප්‍රශ්න එකකට ද III වන කොටසින් ප්‍රශ්න දෙකකට ද ආදී වශයෙන් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ.

## I කොටස

01. පහත සඳහන් ස්වර සංගති උපයෝගී කර ගනිමින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(a) ධධ, පමප, ග, රිස, රිමපනි, ධප
(b) නිසගම, පධප, මපගමධප
(c) ගමපනිස, රිගරිස, නිධප
(d) පධමගරි, රිමපනිස, පනිසරිනිධප

i. ඉහත දක්වා ඇති ස්වර සංගති නිර්දේශිත රාග වලට ගැලපෙන සේ නිවැරදි සංකේත යොදා නැවත ලියන්න. (ල. 1X 4)

ii. ඉහත ස්වර සංගති අයත්වන රාග හතර ඉංග්‍රීසි අක්ෂරය සමඟ නම් කරන්න. (ල. ½ X 4 = 02)

iii. b කොටසට අදාල රාගයේ මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි, අන්තරා කොටස් ප්‍රස්තාර කරන්න. ල. (ස්ථායි 04, අන්තරා 04)

iv. b කොටසට අදාල රාගය සඳහා සුදුසු තානාලංකාර හතරක් ලියන්න. (ඉන් **එක්** තානාලංකාරයක් තිහායි ස්වර කොටසක් සමඟ ලියන්න.) (ල. 04)

v. ඉහත රාග අතරින් ඔබ කැමති රාගයක් ස්වර අභ්‍යාසයක් ලියන්න. (රාගය නම් කළ යුතු වේ.) (ල. 02)

02. වගුව ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | රාගයේ නම | විකෘති ස්වර ගණන | වාදී - සංවාදී | ගාන සමය | විශේෂ ලක්ෂණ |
|---|---|---|---|---|---|
| A | I .......... | දෙකකි. | II .......... | රාත්‍රී දෙවන ප්‍රහාර | ආරෝහණයේ ශුද්ධ ග,නි යෙදෙන අතර අවරෝහණයේ කෝමල ග, නි යෙදේ. |
| B | II .......... | දෙකකි. | IV .......... | V .......... | සම ප්‍රකෘති රාගයක් ද සහිත මෙම රාගයේ රි,ධ ආන්දෝලනය කෙරේ. |
| C | VI .......... | VII .......... | රි, ප | VIII .......... | ආරෝහණයේදී ගාන්ධාරය සහ ධෛවතය දුර්වල නමුත් වර්ජිත නොවේ. |

i. ඉහත වගුවේ සඳහන් I - VIII දක්වා ඇති හිස්තැන් වලට ගැලපෙන පිළිතුරු අදාල රෝම ඉලක්කම සමඟ පිළිතුරු පත්‍රයේ ලියන්න. (ල.½ X 8 =4 )

ii. ඉහත වගුවට ඇතුලත් **නොවූ** නිර්දේශිත රාග අතුරින් ඔබ කැමති රාගයක රාග විස්තරය ලියන්න. (ල. ½ X 8 =4 )

iii. B අක්ෂරයට අදාල සම ප්‍රකෘති රාගය නම්කර එම රාග දෙකෙහි දැකිය හැකි සම විෂමතා තුන බැගින් ලියන්න. (ල. 07)

iv. ඔබ උගත් විලම්භලය ගීතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කර එක් තානාලංකාරයක් ලියා දක්වන්න. (ල. 03)

03. i. භාත්ඛණ්ඩේ පඬිතුමා, V.S. නිගාම් යන සංගීතඥයින්ගෙන් හින්දුස්ථානී සංගීතයට සිදුවූ සේවාව පිළිබඳ විස්තර කරන්න. (ල. 08 )

ii. මූර්කි ස්වර, කන් ස්වර, තිහායි, මුඛඩා යන ශාස්ත්‍රීය සංගීත ශිල්පක්‍රම උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 04)

iii. නිර්දේශිත තාල අතරින් ඔබ කැමති තාල දෙකක් ප්‍රස්තාර කර එම තාල දෙකෙහි දැකිය හැකි සම විෂමතා ලියා දක්වන්න. (ල. 04)

iv. ඛ්‍යාල්, භජන්, ධ්‍රැපද් ගායන ශෛලීන් අතරින් ඔබ කැමති ගායන ශෛලීන් දෙකක් විස්තර කරන්න. (ල. 2 x 2 = 4)

## <u>II කොටස</u>

04. • **අතීතයේ පැවති දේශීය රංග සම්ප්‍රදායන්ගේ උන්නතිය උදෙසා විවිධ සංගීතමය සම්ප්‍රදායයන්ගේ දායකත්වය ලැබී ඇත.**

i. සොකරි හා කෝලම් යන රංග සම්ප්‍රදායන්ගේ දැකිය හැකි සංගීතමය ලක්ෂණ තුන බැගින් ලියන්න. (ල. 06)

ii. නාඩගම් සංගීත ශෛලිය සඳහා කර්ණාටක සංගීතයේ දායකත්වය පිළිබඳ විමසුමක් කරන්න. (ල. 05)

iii. නූර්ති රංග සම්ප්‍රදායේ දැකිය හැකි සංගීතමය ලක්ෂණ පහක් ලියන්න. (ල. 05)

iv. ඔබ උගත් නූර්ති ගීතයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කර ලියන්න. (ල. 04)

05. පහත දැක්වෙනුයේ ජන ගී කීපයක මුල් පාදයන් ය. ඒ ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

a. අන්ද්‍ර ගුවන් හැර නැංග අසුන් පිට
b. කැකුළු සහල් පිටියෙන් ද
c. අනේ ගිරවුනේ මා බස අසාපන්
d. ආල වඩන ගන්ධ කුටියෙ
e. පාට වරුණ පුත
f. චිරා කලක් වසනෙමි කල් බැඳ
g. බ්‍රහ්ම නම් අසුර රජුගෙ
h. අපගෙ මුණි රජාණන්
i. කරුවල තොටේ බං බැහැලා නානකොට
j. අම්මාපල්ල බඹරුන් අත වරද නැති

i. ඉහත ගී පාදයන්ට අදාළ ගී වර්ග ඉංග්‍රීසි අක්ෂර සමඟ නම් කරන්න. (ල. ½ X 10 =5)

ii. ඉහත ගී පාද ආසාතාත්මක හා අනාසාතාත්මක වශයෙන් වෙන් කර ලියන්න. (ල. ½ X 10 =5)

iii. d අක්ෂරයට අදාල ගීතයේ මුල් කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 04)

iv. ඔබ කැමති හටන් ගීතයක මුල් කොටස ගීත ප්‍රස්තාර කරන්න. (ල. 02)

v. දෙතිතේ තිත් ප්‍රභේද නම්කර ඉන් එක් තිත් රූපයකට අයත් උඩරට හා පහතරට බෙර පද ප්‍රස්තාර කරන්න. (ල. 04)

## III කොටස

06. i. ලතින් ඇමරිකානු සංගීතය හා බැඳී පවතින තාල රටා 04 ක් නම් කරන්න. (ල.04)

ii. Melody හා Harmony යන්න උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල.04)

iii. කෝඩ්ස් (Chords) ඇසුරෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න. (රෝම ඉලක්කම් යොදා පිළිතුරු පත්‍රයේ සඳහන් කරන්න.)

| කෝඩ් නාමය | ස්වර | |
|---|---|---|
| C major | C E G | i. ……….................. |
| ii. ……….................. | F A C | iii. …….................. |
| E minor | iv ………………. | v. …....................... |
| Vi ……….................. | D F# A | vii. ……................. |
| Viii ……................. | ix ………………. | ප <u>නි</u> රි |
| D minor | x ………………. | xi. …...................... |
| xii ……………… | A C E | ධ ස ග |

(ල. 12)

iv. පහත සඳහන් අපරදිග ස්වර ප්‍රස්තාර වලට ගැලපෙන ටයිම් සිග්නේචරයන් (Time Signature) නම් කරන්න.




2 x 3 = 6

07. i. බීතෝවන් සහ මෝසාර්ට් යන සංගීතඥයින් විසින් රචනා කළ සංධවනි (Symphony) 02 බැගින් නම් කරන්න. (ල. 04)

ii. පහත සඳහන් මාතෘකා 03 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

• ඔපෙරා (Opera) • Adlib • Plucking Instruments • Brass Family

(ල. 06)

iii. පහත සඳහන් අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පරිවර්තනය කරන්න. (ල. 08)



iv. ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරයේ අයත් ස්කේලය (Scale) නම් කරන්න. (ල. 02)

08. i. පරිගණකයක ඇතුළත් දෘඩාංග (Hardware) 04 ක් නම් කරන්න. (ල. 04)

ii. පරිගණකය නව තාක්‍ෂණික උපකරණයක් ලෙස සංගීත නිර්මාණකරයට දායක කරගන්නා ආකාරය පිළිබඳ විස්තරයක් සපයන්න. (ල. 10)

iii. හඬතල 04 නම් කර වයලීන පවුලේ (Violin Family) සංගීත භාණ්ඩවල තත් සුසර කරගන්නා අයුරු පැහැදිලි කරන්න. (ල. 06)